## 1. 10.

## බාහියසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන බාහියො දාරුචීරියො සුප්පාරකෙ පටිවසති සමුද්දතීරෙ සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවර-පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අථ ඛො **බාහියස්ස දාරුචීරියස්ස** රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'යෙ ච ඛො කෙචි[1] ලොකෙ අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා, අහං තෙසමඤ්ඤතරො'ති.

අථ ඛො බාහියස්ස දාරුචීරියස්ස පුරාණසාලොහිතා දෙවතා අනුකම්පිකා අත්ථකාමා බාහියස්ස දාරුචීරියස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය, යෙන බාහියො දාරුචීරියො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බාහියං දාරුචීරියං එතදවොච: 'නෙ ච ඛො ත්වං බාහිය අරහා, නාපි අරහත්තමග්ගං වා සමාපන්නො. සාපි තෙ පටිපදා නත්ථි යාය වා ත්වං අරහා අස්ස,[2] අරහත්තමග්ගං වා සමාපන්නො'ති. 'අථ කො චරහි සදෙවකෙ ලොකෙ අරහන්තො වා, අරහත්තමග්ගං වා සමාපන්නො?'ති. 'අත්ථි බාහිය උත්තරෙසු ජනපදෙසු සාවත්ථි නාම නගරං. තත්ථ සො භගවා එතරහි විහරති අරහං සම්මාසම්බුද්ධො. සො හි බාහිය භගවා අරහා චෙව, අරහත්තාය ච ධම්මං දෙසෙතී'ති.

අථ ඛො බාහියො දාරුචීරියො තාය දෙවතාය සංවෙජිතො තාවදෙව සුප්පාරකා[3] පක්කාමි සබ්බත්ථ එකරත්තිපරිවාසෙන. යෙන සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො[4] තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චඞ්කමන්ති. අථ ඛො බාහියො දාරුචීරියො යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: 'කහන්නු ඛො භන්තෙ එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො? දස්සනකාමම්හා මයං තං භගවන්තං[5] අරහන්තං සම්මාසම්බුද්ධ'න්ති. 'අන්තරඝරං පවිට්ඨො ඛො බාහිය, භගවා පිණ්ඩායා'ති.

2. අථ ඛො බාහියො දාරුචීරියො තරමානරූපො ජෙතවනා නික්ඛමිත්වා සාවත්ථිං පවිසිත්වා අද්දස භගවන්තං සාවත්ථියං පිණ්ඩාය චරන්තං පාසාදිකං පසාදනීයං සන්තින්ද්‍රියං සන්තමානසං උත්තමදමථසමථම-

නුපපතනං[6] දනතං ගුතතං සත්‍ත්‍රියං නාගං. දිස්වාන යෙන භගවා තෙනුපසඞකමි. උපසඞකමිත්‍වා භගවතො පාදෙ සිරසා නිපතිත්‍වා භගවනතං එතදවොච: 'දෙසෙතු මෙ භනෙත භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, යං මමසස දීඝරතතං හිතාය සුඛාය'ති.

1. සෙ බො කොචි, මජසං. 2. අසසසි, සයා. 3. සුපපාරකමහා, මජසං. 4. භගවා සාවත්‍ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකසස ආරාමෙ, සී. 5. දසසනකාමමහා භගවනතං, මජසං. 6 උතතමසමුඵදමථමනුපපතතං, මජසං.



## 1. 10.

## බාහිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වසන සේක.

එසමයෙහි (දරවැහැරි දරන හෙයින්) **දරුචීරිය** නම් වූ **බාහිය** තෙමේ ජනයා විසින් සත්කාර කරන ලද්දේ, ගුරුකාර කරන ලද්දේ, බුහුමන් කරන ලද්දේ, පුදන ලද්දේ, අපචායනය (යටත් පැවැතුම්) කරන ලද්දේ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය බෙහෙත් පිරිකර ලබන සුලු වූයේ, මුහුදු තෙර **සුප්පාරක** පටුනෙහි වෙසෙයි. එකල්හි රහසිගත වූ, හුදෙකලා වූ, බාහිය දරුචීරියහට "ලොකයෙහි රහත් වූ හෝ රහත්මගට පිළිපන් හෝ යම් කිසි කෙනෙක් (වෙත් නම්) මම් ඔවුනතුරෙන් එකෙකි-මි"යි මෙසේ චිත්තසංකල්පනාවෙක් පහළ විය.

එකල්හි ඒ දරවැහැරිසිවුරු දරන බාහිය පිරිවැජියාගේ පැරැණි සහලේ නෑ දෙවියෙක් අනුකම්පා කරනුයේ වැඩ කැමැත්තේ දරුචීවරික පිරිවැජි-යාගේ චිත්තපරිවිතර්කය සිය සිතින් දැන, දරුචීරිය බාහිය පිරිවැජියා වෙත පැමිණියේ ය. පැමිණ දරුචීරිය බාහියහට මෙසේ කී ය; "බාහියය, තෝ රහතෙක් නො වෙහි. රහත්මගට පිළිපන්නෙක් ද නො වෙහි. යම් ප්‍රතිපත්තියෙකින් තෝ රහත් හෝ වන්නෙහි නම්, රහත්මගට පිළිපන්නෙක් හෝ වන්නෙහි නම්, ඒ ප්‍රතිපත්තිය ද තට නැතැ"යි කී ය. "එසේ නම් දෙවියන් සහිත ලොකයෙහි දැන් කවරෙක් නම් රහත් හෝ රහත්මගට පැමිණියේ හෝ වේ දැ?"යි හේ ඇසී ය. "බාහියය, උතුරුජනවියෙහි සැවැත් නම් නුවරෙක් ඇත. එහි අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් වසන සේක. බාහියය, ඒ භාග්‍යවතුන් වහන්සේ රහත් ද (වෙති] රහත්බව පිණිස ධර්මය ද දෙසති"යි කී ය.

ඉක්බිති, දරුචීරිය බාහිය තෙමේ ඒ දෙවියා විසින් සංවේගයට පමුණු-වන ලදු ව ඒකෙණෙහි ම සුප්පාරක පටුනෙන් පිටත් විය. සියලු තැන්හි එක්රැයක් (පමණක්) විසීමෙන් සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහුගේ

ජේතවනාරාමයට එළැඹියේ ය. එසමයෙහි බොහෝ භික්ෂූහු අභ්‍යවකාශයෙහි සක්මන් කෙරෙති. ඉක්බිති දාරුචීරිය බාහිය තෙමේ ඒ භික්ෂූන් කරා එළැඹියේ ය. එළැඹැ ඒ භික්ෂූන්හට "ස්වාමීනි, ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වාසය කරන සේක් ද? අපි ඒ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දකිනු කැමැත්තම්හ"යි කී ය. "බාහියය, ඒ භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස ඇතුළුගමට පිවිසි සේකැ"යි ඒ භික්ෂූහු කීහ.

ඉක්බිති දාරුචීරිය බාහිය තෙමේ වේලෙවි සවභාව ඇත්තේ ජේතවනයෙන් නික්මැ සැවැත්නුවර පිවිසැ, සැවැත්නුවර පිඬු පිණිස හැසිරෙන්නාවූ, ප්‍රසාදවහ වූ, ප්‍රසාදනී වූ, සන්හුන් ඉඳුරන් ඇති, සන්හුන් සිත් ඇති, උතුම් වූ (ඉන්ද්‍රිය) දමනයට හා (ඉන්ද්‍රිය) ශමථයට පැමිණැ සිටි, (කයින්) දැමුණු (වචනයෙන්) රැකුණු (සිතින්) සංවර වූ ඉන්ද්‍රියයන් ඇති, (ඡන්දාදියෙන් අගතියට නොයන හෙයින්) නාග (ශ්‍රේෂ්ඨ) වූ භාග්‍යවතුන් වහන්සේ දිටී ය. දැකැ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹැ භාග්‍යවතුන් වහන්සේගේ දෙපාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් ධර්මයක් මට බොහෝ කාලයක් හිත පිණිස සුව පිණිස පවත්නේ ද, ඒ ධර්මය භාග්‍යවතුන් වහන්සේ මට දෙසන්වා. සුගතයන් වහන්සේ ධර්මය දෙසන්වා"යි කී ය.